SINHALA

**Ministero dell'istruzione, dell'università e della ricerca**
Istituto Comprensivo don Lorenzo Milani
Via Monte Bisbino 12, 20900 Monza
Tel. 039.735350- Fax 039.2720792
e-mail: miic8ae005@istruzione.it
sito: www.donmilanimonza.gov.it

# සමවගකීම සහිත අධ්‍යාපනික ගිවිසුම

(Art.3 DPR 235/2007)

සමවගකීම සහිත අධ්‍යාපනික ගිවිසුම යනු පාසල සහ පවුල් සංස්ථාව සමග පවතින සම්බන්ධතාවය පැහැදිලි කිරීමත් ඒ පිළිබඳව දැනුවත් වීමෙන් අදාළ වගකීම් නොපිරිහෙලා ඉටු කිරීමට එකග වීමට ගුරුවරු, දෙමාපියන් සහ සිසු දරුවන් විසින් අත්සන් කරනු ලබන ලේඛණයකි.සහයෝගයෙන් නීති රීති වලට පොදුවේ ගරු කිරීම ,ජීවත් වීමට සහ සහජීවනය සඳහා අන්‍යෝන්‍යය විශ්වාසය ගොඩනගා ගැනීමට නැතිවම බැරි අත්‍යාවශ්‍යය පදනමක් වෙනවා මෙන්ම ඇතැම් පොදු වටිනාකම් අගයමින් පාසලක් වශයෙන් සාක්ෂාත් කරගැනීමට අපේක්ෂා කරන ඉලක්ක වන්නේ : 1) හෙට දිනයේ අනාගත සමාජයක් නිර්මානය කල හැකි නිවැරදි පුරවැසියන් බිහිකිරීම සඳහා සිසුන්ගේ සාමාජීය සහ පෞද්ගලික වර්ධන ක්‍රියාදාමයේදි ඔවුන්ට මග පෙන්වීම; 2) අනෙකාට ගරු කිරීම සඳහා සිසුවා/ දරුවා හට තමා පිළිබඳව පූර්ණ ස්වයං අවබෝධයක් ලබාදීම; 3)අපහසුතාවයන් වැළැක්වීම සහ ස්ථිරසාර පියවර හරහා ප්‍රවර්ධනය කෙරෙන්නේ පූර්ණ පෞරුෂත්ව වර්ධනය තුළ එහි නොයෙක් පැතිකඩ මගින් අත්දැකීම් ලබන්නේ අධ්‍යාපනික පරිසරය තුළ **සැබෑවටම** අයිතිවාසිකම් සහ වගකීම් හඳුනාගැනීමටයි.මෙම ගිවිසුමට අත්සන් කිරීමෙන් ගම්‍ය වන්නේ එයට ගරු කිරීමටත් එය පිළිපැදීමටත් බැඳී සිටිනා බවයි.

## සිසුන්ගේ අයිතිවාසිකම්

- තම සාමාජීය ජනවාර්ගික සහ ආගමික පසුබිම කුමක් වුවද පුද්ගලයෙකු ලෙස ගෞරවය ලැබීම
- තම අදහස් ප්‍රකාශ කිරීමට හැකි වීම
- පාසල් වැඩ වලදි ගුරුවරුන්ගේ අවධානය ලැබීම සහ එයට ගතවන කාළය සඳහා නිසි ගරුත්වයක් ලැබීම
- ආරක්ෂිත, පිරිසිදු සහ සෞඛ්‍යය සම්පන්න පරිසරයක අධ්‍යාපනික කාළය ගත කිරීමට හැකි වීම

## සිසුන්ගේ වගකීම්

- සම වයසේ අයට සහ වැඩිහිටියන්ට ගෞරවනීය වීම
- තමන්ගේ වගකීම් නිසියාකාරව තේරුම් අරගනිමින් පාසල් කාළය තුළ ඊට අනුරූපිව ක්‍රියාකාරීව සහභාගි වීම
- අධ්‍යාපනික ආයතනයේ ස්ථාපිත රෙගුලාසි වලට අනුකූලව හැසිරීමට වගවීම
- පාසලේ ගෘහ භාණ්ඩ සහ එම පරිසරයට ගරු කිරීමටත් තමන් පරිහරණය කල තැන් පිරිසිදුවට සහ පිළිවෙලට තබා ගැනීම
- පාසලේ නීති වලට ගරු කිරීම: නොකඩවා පැමිණිම, වේළාවට පැමිණිම , පාසලට අවශ්‍යය දේ පරිස්සම් කරගැනීම, පවරන ගෙදරවැඩ කරගෙන යාම

## පවුලේ අයිතිවාසිකම්

- ඔබගේ දරුවාගේ අධ්‍යාපනයේ ප්‍රගතිය සහ හැසිරීම පිළිබඳව මෙන්ම පාසලේ සංවිධානය සම්බන්ධයෙන් අවශ්‍යය තොරතුරු මගින් දැනුවත් වීම
- ගුරුවරුන් මුණගැසීමට නියමිත දින වලදී මෙන්ම අවශ්‍යය නම් ඔබට පහසු දිනයක් වෙන්කරවා ගතහැකිවීම
- පාසල පිළිබඳව ඔබගේ අදහස් ප්‍රකාශ කිරීම සහ එහි නිපුණතාවන්ට අනුකූලව ඔබගේ යෝජනා ඉදිරිපත් කිරීම

## පවුලේ වගකීම

- පාසලේ රැස්වීම් සහ හමුවීම් අවස්ථාවන්ට සහභාගි වීම: කාරක සභා, රැස්වීම්, කැඳවීම් සහ ගුරුදෙගුරු හමුවීම්
- දරුවාගේ අධ්‍යාපනයට බාධා වේ යැයි සිතිය හැකි ගැටලු මතු වුවහොත් ඒ පිළිබඳව ගුරවරු දැනුවත් කිරීම
- "විවේචනාත්මක තත්ත්වයන්" ඇති වුවහොත් පංතියේ ගුරවරු දැනුවත් කිරීම
- තමන්ගේ සංස්කෘතියට හා සම්ප්‍රදායට වෙනස් දේ ගැන දරුවා දැනුවත් කිරීමට පාසලට සහයෝගය දැක්වීම
- තම දරුවාගේ ඉගෙනීමට සහ පුහුණුවට අදාළ ක්‍රියාදාමයට සහයෝගය දැක්වීම
- තම දරුවා නියමිත වේළාවට නොකඩවා පාඩම් වලට සහභාගි කරවීමට සහතික වීම
- දරුවා පාසලට නොපැමිණි නම් සහ ප්‍රමාදීව පැමිණෙන සෑම විටෙකම එය සාධාරණීකරණය කිරීමට වගවීම
- දරුවාට දෙන ලකුණු මෙන්ම පාසලෙන් එවන සන්නිවේදන ඔබ දුටුබවට නිරතුරුවම අත්සන් කිරීම
- පාසල් බෑගය දිනපතා පරීක්ෂා කිරීමෙන් අනවශ්‍යය දෑ පාසලට ගෙන ඒම වැළැක්වීම
- ආහාර සමග සමතුලිත සම්බන්ධතාවයක් ඇති කරවීම සහ කෑම මේසයේදී හොඳ පුරුදු අනුගමනයට පුරුදු කරවීම
- සනීපාරක්ෂක නීති වලට ගරු කිරීමටත් පාසලට ගැලපෙන ඇඳුම් ඇඳීමටත් වගවීම
- අධ්‍යාපනික ආයතනයේ නීති රෙගුලාසි පිළිබඳව දැනුවත් වීම සහා ඒවා පිළිපැදීම

## ගුරුවරුන්ගේ අයිතිවාසිකම්

- ආයතනය පිළිබඳව, සිසුන්ගේ පවුල් සම්බන්ධව, තම කාර්යාල මණ්ඩලය සහ අනෙකුත් පාසලේ සේවකයින් පිළිබඳව නිදහස්ව සිය අදහස් ප්‍රකාශ කිරීමට හැකිවීම
- "සිසුවාගේ ඉගෙනීමට සහ පුහුණුවට අදාළ ක්‍රියාදාමයට සහයෝගය දැක්වීම සහ එය වැඩි දියුණුවට අවශ්‍යය ක්‍රම සහ උපාය මාර්ග තෝරා ගැනීම
- වෘත්තීය ගෞරවය හිමි වීම

## ගුරුවරුන්ගේ යුතුකම්

- ඉගැන්වීමට අදාළ සියල්ල නිර්වචනය කොට එහි ඇති සෑම අංගයක්ම ඉදිරිපත් කිරීම
- සමාජයේ සහයෝගයෙන් කටයුතු කිරීමට අවශ්‍යය නීති රීති සිසුන් සමග සාමුහිකව තීරණය කිරීමෙන් ඔවුන්ගේ අභ්‍යන්තරයෙන්ම තමන්ට ගරු කිරීමටත් අනෙකාට සහ පරිසරයට ගරු කරමින් බෙදාහදා ගැනීමට මග සෑදීම
- දරුවන්ගේ නිපුණතා වර්ධනයට අවශ්‍යය ස්ථාවර සහ ක්‍රියාකාරී මැදිහත් වීම් සහ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම
- දරුවන් තුළ ඉගෙනීමට උනන්දුව ඇති කර දිරිමත් කිරීම
- සිසුන් සහ එම පවුල් සමග සහයෝගිතාවය සහ සංවාදය හරහා සන්සුන් සහ විස්වාසනීය වාතාවරණයක් ඇති කරගැනීම
- පැහැදිලි නිර්ණායක මගින් සිසුවාගේ ඉගෙනීමේ මාවතේ ලද හැකියාවන් නිපුණතා සහ හැසිරීම් පිළිබඳව පරීක්ෂා කිරීම
- දරුවාගේ අධ්‍යාපනික තත්ත්වය පිළිබඳව වරින් වර දෙමාපියන් දැනුවත් කිරීම
- දරුවාගේ පාසල් ගමන් මාර්ගයේ සෑම පියවරකදීම මග පහදා දෙමින් කැඳවාගෙන යෑම
- යම් කිසි ලෙසකින් ගැටලුවක් මතු වුවහොත් දරුවාගේ දෙමිපියන් කැඳවා ඔවුන් හට සවන් දීමෙන් එක්ව අදාළ අපහසුතාවයට පිළියම් යෙදීම
- සිසුන්ගේ ආරක්ෂාව පිළිබඳව අධීක්ෂණය කිරීම
- පාසලේ විෂයන් වලදි සහභාගි වීමේ වෙනස්කම් දුටු වහාම දෙමව්පියන්ගේ අවධානයට යොමු ක්රීම
- පෝෂණය පිළිබඳව දැනුම ප්‍රවර්ධනය කර සිසුන්ට ලබාදෙන නොයෙක් වර්ගයේ ආහාර වර්ග රස බැලීමට ආරාධනා කිරීම

| Dirigente/Docente delegato | දෙමාපිය අත්සන | ශිෂ්‍යයා/පංතිය/පාසල |
| --- | --- | --- |
| ______________________ | ____________ | ______________________ |

Monza,_______________ ______________________